ක්රියාවන් හයකි. මිනිසුන් සිව් දෙනෙකි. එසේ නම්, අනිවාර්යය කරන කරුණු දෙක, සමානයට සමානය, යහපතට ඒ හා සමාන දස ගුණය හා යහපතට හත්සීය ගුණය වේ

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව හුරෙයිම් ඉබ්නු ෆාතික් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "ක්රියාවන් හයකි. මිනිසුන් සිව් දෙනෙකි. එසේ නම්, අනිවාර්යය කරන කරුණු දෙක, සමානයට සමානය, යහපතට ඒ හා සමාන දස ගුණය හා යහපතට හත්සීය ගුණය වේ. අනිවාර්යය කරන කරුණු දෙක වනාහි: කවරෙකු අල්ලාහ්ට යමක් ආදේශ නො කරන තත්ත්වයේ මිය ගියේ ද ඔහු ස්වර්ගයට පිවිසීය. කවරෙකු අල්ලාහ්ට යමක් ආදේශ කරන තත්ත්වයේ මිය ගියේ ද ඔහු අපා ගින්නට පිවිිසෙයි. සමානයට සමානය වනාහි: තම සිතට හැඟෙන තරමට හා අල්ලාහ් ද එය ඔහුගෙන් හඳුනා ගන්නා තරමට කවරෙකු යම් යහපතක් සිතුවේ ද ඔහුට කුසලක් ලියනු ලැබේ. කවරෙකු යම් නපුරක් සිදු කළේ ද ඔහුට නපුරක් ලියනු ලැබේ. කවරෙකු යම් යහපතක් සිදු කළේ ද ඒ හා සමාන කුසල් දහයක් හිමි වේ. කවරෙකු අල්ලාහ්ගේ මාර්ගයේ යමක් වියදම් කළේ ද කුසල හත්සීය ගුණයකින් ගුණ වේ. මිනිසුන් වනාහි: මෙලොවෙහි විස්තීරණභාවය ලබා මතුලොවෙහි පීඩනයට ලක් වන්නා ද ඔවුන්
අතර සිටී. මෙලොවෙහි පීඩනයට ලක්ව මතුලොවෙහි විස්තීරණභාවය ලබන්නා ද ඔවුන් අතර සිටී.එමෙන්ම මෙලොවෙහි මෙන්ම මතුලොවෙහි ද පීඩනයට ලක් වන්නා ද මෙලොවෙහි මෙන්ම මතුලොවෙහි විස්තීරණභාවය ලබන්නා. ද ඔවුන් අතර සිටී." [حسن] [رواه أحمد]

සැබැවින්ම ක්රියාවන් වර්ග හයක් සහ මිනිසුන් කොටස් හතරක් බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. ක්රියාවන් වර්ග හය නම්: පළමුවැන්න: කවරෙකු අල්ලාහ්ට ආදේශ නොකළ තත්ත්වයේ මිය ගියේ ද ඔහුට ස්වර්ගය අනිවාර්යය විය. දෙවැන්න: කවරෙකු අල්ලාහ්ට යමක් ආදේශ කළ තත්ත්වයේ මිය ගියේ ද ඔහුට අපා ගින්න අනිවාර්යය විය. ඔහු එහි සදාතනිකයෙකු වේ. ඒ දෙකම අනිවාර්යය කරනු ලබන දෑය. තුන්වැන්න: දැහැමි චේතනාව. කවරෙකු යහපතක් කිරීමට චේතනා කර ඔහුගේ චේතනාව තුළ හදවතට දැනෙන තරම් ඔහු අවංක වී, අල්ලාහ් ද ඔහුගේ එම චේතනාව හඳුනා ගෙන, පසු ව ඔහුට යම් කරුණක් අවහිර වී එම ක්රියාව සිදු කිරීමට නොහැකි වී නම්, ඔහුට පූර්ණ කුසලක් ලියනු ලැබේ. සිව්වැන්න: නපුරු ක්රියාව. කවරෙකු නපුරක් සිදු කළේ ද ඔහුට එක් පාපයක් ලියනු ලැබේ. මේ දෙකම කිසිදු ගුණ කිරීමකින් තොර ව එකකට එකක් ලෙස සමානයට සමානයක් ලෙස පිරනමනු ලැබේ. පස්වැන්න: කුසල් දස ගුණයක් බවට පත්වන යහපත. එනම් කවරෙකු යම් යහපතක් චේතනා කොට එය සිදු කළේ ද ඔහුට ඒ හා සමාන කුසල් දහයක් ලියනු ලැබේ. හයවැන්න: කුසල් හත්සීයකින් ගුණ වන යහපත. එනම් කවරෙකු අල්ලාහ්ගේ මාර්ගයේ යමක් වියදම් කළේ ද, එම යහපතට හත්සීය ගුණයක් කුසල් ඔහු වෙනුවෙන් සටහන් කරනු ලැබේ. මෙය උත්තරීතර ත්යාගශීලී අති උත්කෘෂ්ඨ අල්ලාහ් තම ගැත්තන්හට පිරිනමන ඔහුගේ භාග්යයයි. මිනිසුන් කණ්ඩායම් හතර නම්: පළමුවැන්නා: මෙලොව පෝෂණ සම්පත් හි විස්තීරණත්වය ලැබු, තමන් එහි දකින කැමති දෑ භුක්ති විදින, නමුත් ඔහුගේ මතුලොව ජීවිතය පටු වන, ඔහුගේ අවසන් ගමන නිරය බවට පත්වන තැනැත්තා. ඔහු දේවත්වය ප්රතික්ෂේප කරන පොහොසතාය. දෙවැන්නා: මෙලොවෙහි පෝෂණ සම්පත් පටු වූ නමුත්, මතුලොවෙහි විස්තීරණත්වය පිරිනමනු ලබන, තම අවසන් ගමන ස්වර්ගය වෙත පිහිටන තැනැත්තා. ඔහු දේවත්වය විශ්වාස කළ දිළින්දාය. තුන්වැන්නා: මෙලොවෙහි මෙන්ම මතුලොවෙහි පීඩනයට පත්වන තැනැත්තා. ඔහු දේවත්වය ප්රතික්ෂේප කළ

දිළින්දාය. සිව්වැන්නා: මෙලොවෙහි මෙන්ම මතුලොවෙහි විස්තීරණ තත්වය ලැබූ තැනැත්තා. ඔහු දේවත්වය විශ්වාස කළ පොහොසතාය.

http://www.sunnah.global/hadeeth/si/show/65014